චක්‍ර ලේඛ අංක:- 6/97

සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1997.09.01

බස්නාහිර පළාතේ සියළුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

## සමුපකාර සේවක කාර්‍ය විධිවිධාන සංග්‍රහය

සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් 96.10.25 වන දින අනුමත කරන ලදුව නිකුත් කර ඇති 'සමුපකාර සේවක කාර්‍ය විධිවිධාන සංග්‍රහයේ ' අංක 5:5:13 සහ අංක 5:7:1 යන වගන්ති හැර අනිකුත් විධිවිධාන ඒ අයුරින්ම බස්නාහිර පළාතේ සමුපකාර සේවකයන්ට ද බලපාන පරිදි 1997.09.01 දින සිට ක්‍රියාත්මක කිරීමට මෙම කොමිෂන් සභාව තීරණය කොට ඇ

02. එම සංග්‍රහයේ දක්වා ඇති කරුණු මෙතෙක් ඒ කරුණු සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව විසින් හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ අභිබවා 'සමුපකාර සේවක කාර්‍ය විධිවිධාන සංග්‍රහය ' බස්නාහිර පළාත තුළ බලාත්මක කළ දින සිට ක්‍රියාත්මක වේ.

03. එම කාර්‍ය විධිවිධාන සංග්‍රහයේ අංක 5:5:13 වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කරගත යුතු ය.

5: :13 ' බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කර ඇති හෝ පත් කරනු ලබන විනය පරීක්ෂණ නිලධාරී ලැයිස්තුවේ සඳහන් නිලධාරීන් අතුරින් සුදුසු අයකු සමිතිය විසින් පවත්වාගෙන යනු ලබන විනය පරීක්ෂණය සඳහා නිලධාරියකු ලෙස පත්කර ගත හැකි ය.'

04. එම කාර්‍ය විධිවිධාන සංග්‍රහයේ අංක 5:7:1 වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කර ගතයුතු ය.

5:7:1 ' 1981.12.01 වන දින අංක 169/8 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති රෙගුලාසි මාලාවේ 114 වන රෙගුලාසිය අනුව පරීක්ෂණ නිලධාරියා ගේ ඕනෑම නිගමනයක් හෝ සියලුම නිගමනයන් හෝ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සමිතියට බලය ඇතත් ඒ සම්බන්ධයෙන් ගතයුතු විකල්ප ක්‍රියාමාර්ගයක් රෙගුලාසි මාලාවේ සඳහන් නොමැති බැවින් එවැනි අවස්ථාවලදී විනය පරීක්ෂණ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් මගින් විධිමත් විනය පරීක්ෂණය කරන ලද නිලධාරියා ගේ වාර්තාව විමර්ශණයට භාජනය කොට එම මණ්ඩලය විසින් ගනු ලබන නිගමනයන්ට අනුකූලව කටයුතු කළ යුතු ය.'

05. I වන පරිශිෂ්ඨයේ තනතුරු පිළිබඳ ඇත්වීමේ වෙනත් විස්තර යටතේ අංක 01 ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කර ගත යුතු ය.

' බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 1996/02 අංක හා 1996.06.27 දින දරණ චක්‍රලේඛයේ මෙම තනතුරු සඳහා නියම කර ඇති වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. '

06. මෙම සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහය බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක කිරීමේ එම සංග්‍රහයේ පහත සඳහන් වචන වෙනුවෙන් දී ඇති අර්ථ කථනයන් වෙනුවට පහත සඳහන් අර්ථ කථනයක් ආදේශ කිරීමෙන් අදාල කරගත යුතු ය.

' කොමිෂන් සභාව' යන්නෙන් 1994 අංක 01 දරන බස්නාහිර පළාතේ පළාත් සභා සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ සංස්ථාපනය කරන ලද බස්නාහිර පළා සමුපකාර සේවක කොමිෂන් සභාව අදහස් කෙරේ.

' සමුපකාර කොමසාරිස්' යන්නෙන් බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වරයා අදහස් කෙරේ.

' පත් කිරීම ' යන්නෙන් බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්ති විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව විසින් නියම කරන ලද සුදුසුකම් ඇති පුද්ගලයකුට වැටුප් සහිත යම් කිසි තනතුරකට පසුව ස්ථිර කිහීමට යටත්ව ප්‍රදානය කිරීම අදහස් කෙරේ.

' සමුපකාර සේවකයා' යනු සිය වැටුප හා වෙනත් ගෙවීම් සමුපකාර සමිතියක අරමුදලින් ලබාගන්නා සේවකයකු සැලකේ.

' සමුපකාර සමිතිය' යන්නෙන් සමුපකාර සමිති පනත යටතේ බස්නාහිර පළාත තුළ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් අදහස් කෙරේ.

' ලේකම් ' යනුවෙන් වෙනත් අර්ථකථනයක් දී නොමැති අවස්ථාවලදී බස්නාහිර පළා සමුපකාර සේවක කොමිෂන් සභා වේ ලේකම්වරයා අදහස් කෙරේ.

07. මෙම සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහය බස්නාහිර පළාතේ සමුපකාර සේවා යන්ට අදාල කරවීමේ හේතුවෙන් ලැබෙන ප්‍රතිලාභයන් වෙතොත් එකී ප්‍රතිලාභයන්ට 1997.09.01 දිනට පෙර සේවයෙන් ඉවත් වූ හෝ විශ්‍රාම ගත්තා වූ හෝ අන් අයුරකින් සේවයෙන් ඉවත් වූ සේවකයන් හිමිකම් නොවනු ඇත.

08. සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ පිටපත් අංක 32/1, ... ... නාවතේ පිහිටි සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් මිලට ගෙන ඉදිරියේදී කරනු ලබන සංශෝධන ද සහිතව යාවත්කාලීනව ... තැබීමට සියුලුම සමුපකාර සමිතිවල ප්‍රධානීන් වගබලා ගතයුතු ය.

.../03